# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/EST/2/2/CMA/(IV) | ........................................ | 2026.01.05. |

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත.

<u>**සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම**</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඉහත සමාංක හා 2025.12.31 දිනැති ලිපිය හා බැඳේ.

02. සමෘද්ධි සංවර්ධන නිලධාරීන් නියමිත දිනට විශ්‍රාම නොගැන්වීම හේතුවෙන් ගැටළු රාශියකට මුහුණුපා ඇත.

03. වැඩිපුර සේවය ලබාගත් කාලයට අදාළව වැටුප් ගෙවන තෙක් විශ්‍රාම වැටුප ගෙවීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේද ප්‍රතිපත්තිමය තීරණ හෝ නීතියක් නොමැති බැවින් වැඩිපුර ලබාගත් වැටුප නිලධාරියා විසින් නැවත ගෙවිය යුතුව ඇත.

04. එසේවුවද මෙම නිලධාරීන්ට එම වැටුප ගෙවීමට ද හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වේ. මේ වන විට වැඩිපුර සේවය කළ නිලධාරීන් සම්බන්ධව කැබිනට් පත්‍රිකාවක් සකස් කර ඒ පිළිබඳව අමාත්‍යාංශ මට්ටමෙන් සාකච්ඡාවක් ද පවත්වා ඇත. එහිදී මෙවැනි වැඩිපුර සේවය කළ නිලධාරීන් ඔබ දිස්ත්‍රික්කය තුළද සිටිය හැකි බැවින් ඉහත දන්වන ලද ලිපිය සමග යොමුකළ ආකෘති පත්‍රයට අනුව අදාළ තොරතුරු යොමු කරන මෙන් දන්වමි. මෙම තොරතුරු සම්බන්ධයෙන් හෙට දින ගරු අමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සහ අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පැවැත්වීමට නියමිතව ඇත.

05. එබැවින් මේ සඳහා ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර, ප්‍රමුඛතාවය ලබාදී අදාළ තොරතුරු හෙට (2026.01.06) මධ්‍යහන 12.00ට පෙර ලබා දීමට පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

06. මීට පෙර ලබා දී ඇති උපදෙස් පරිදි ක්‍රියා නොකිරීම හේතුවෙන් පැන නැගී ඇති මෙවැනි ගැටළු සම්බන්ධව මේ වන විට අදාළ නිලධාරීන්ගෙන් නිදහසට කරුණු විමසීම් කරන බැවින් මෙම කාර්යය ඉතා වගකීමෙන් යුතුව සිදු කරන ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

සී. ඩී. කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්.


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |